# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1415/18 – 2005 ඔක්තෝබර් 19 වැනි බදාදා – 2005.10.19**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. - 01/2005

**2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත**

2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනතේ 204 වන වගන්තිය යටතේ වෙළඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ,
වෙළඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍ය.

2005 ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

01. මෙම නියෝග 2005 අංක 01 දරන බුද්ධිමය දේපල නියෝග ලෙස හඳුන්වනු ලබන අතර 2005.10.19 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

ප්‍රකාශන හා සම්බන්ධිත අයිතිවාසිකම්

2. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව (මෙහි මින්මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) බුද්ධිමය දේපල පනතේ 9 වන වගන්තියේ නිශ්චිතව දැක්වෙන කවර හෝ ක්‍රියාවක් කිරීම සඳහා බලය දීම වෙනුවෙන් ප්‍රකාශන අයිතියේ හිමිකරුට එම හිමිකරු සහ එම බලය ලබන තැනැත්තා එකඟ වන පරිදි ගෙවීමක් ලැබීමට අයිතිවාසිකම් තිබිය යුතු ය.

(2) පනතේ 17, 18 හා 20 වගන්තිවල සඳහන් කවර හෝ ක්‍රියාවක් කිරීම සඳහා බලය දීම වෙනුවෙන් පිළිවෙලින් සෑම ඉදිරිපත් කරන්නෙකුට හෝ ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීමක නිෂ්පාදකයෙකුට හෝ විකාශන සංවිධානයකට, ඒ ඉදිරිපත් කරන්නා හෝ ශාබ්ධික පටිගත කිරීමේ හෝ තැටිගත කිරීමේ නිෂ්පාදකයා හෝ විකාශන සංවිධානය සහ එකී බලය ලබා ගත් තැනැත්තා අතර එකඟ වන පරිදි ගෙවීමක් ලැබීමට අයිතිවාසිකම් තිබිය යුතු ය.

3. (1) තමාගේ කිසියම් අයිතිවාසිකමක් උල්ලංඝනය වීම නිසා අතෘප්තියට පත් (මෙහි මින් ඉදිරියට "ඉල්ලුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු විසින් පනතේ 22 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඉදිරිපත් කරන සෑම ඉල්ලීමක්ම, එම ආරවුල පවත්නා බව ඉල්ලුම්කරුට දැනගන්නට ලැබී එක් මාසයක් ඇතුළත ඉදිරිපත් කළ යුතු අතර, ඒ ඉල්ලීම මෙහි පළමුවන උපලේඛනයේ දැක්වෙන 'සී 01' දරන ආකෘතියට සාරානුකූල විය යුතු ය. එම ඉල්ලීම ඉල්ලුම්කරු හෝ විධිමත් ලෙස පත් කරන ලද ඔහුගේ අනුයෝජිතයකු විසින් අත්සන් කර තිබිය යුතු ය.

(2) එම ඉල්ලීමෙහි විසඳිය යුතුව තිබෙන ආරවුල පිළිබඳව පැහැදිළි හා සංක්ෂිප්ත ප්‍රකාශයක් ඇතුළත් විය යුතු අතර ඉල්ලුම්කරු කියා සිටින හිමිකම් පෑම තහවුරු කිරීම පිණිස දිවුරුම් පත්‍රයක් මගින් වූ සාක්ෂි යා කර තිබිය යුතු ය.

(3) ඉල්ලුම්පත්‍රය පිටපත් දෙකකින් සෑදී තිබිය යුතු ය.

(4) ඉල්ලීම ලැබුන විට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ඉල්ලීමෙහි පිටපතක් එම අයිතිවාසිකම් උල්ලංඝනය කරන ලදැයි කියන (මෙහි මින් ඉදිරියට "ප්‍රෝක්ත උල්ලංඝනකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තා වෙත එම ඉල්ලුම් පත්‍රයේ අන්තර්ගත කරුණු පිළිබඳව නිරීක්ෂණ ඉදිරිපත් කරන ලෙසට ඉල්ලීමක් ද සමග භාරදීමට සැලැස්විය යුතු ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඉල්ලීම ලැබී එක් මාසයක් ඇතුළත ප්‍රෝක්ත උල්ලංඝනකරු විසින් ඔහුගේ නිරීක්ෂණ ඉදිරිපත් කළ යුතු ය.

(6) ඉල්ලුම්කරුගේ හිමිකම්පෑම් වලට ප්‍රතිවිරුද්ධව කරුණු ඉදිරිපත් කර අදාල ආරවුල පිළිබඳව තමාගේ ස්ථාවරය සනාථ කිරීම සඳහා යම් සාක්ෂි ඇත්නම් දිවුරුම් පත්‍රයක් මගින් එම සාක්ෂි ද සමග ප්‍රෝක්ත උල්ලංඝනකරු විසින් ඔහුගේ නිරීක්ෂණ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(7) එම නිරීක්ෂණ ලැබුණ විට අධ්‍යක්ෂ ජනරාල්වරයා හැකිතාක් ඉක්මනින් විභාගය සඳහා දිනයක් නියම කර පාර්ශවකරුවන්ට එය දැනුම් දිය යුතු ය.

(8) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අන්‍යාකාරව විධානයක් කරනු ලැබුවහොත් මිස විභාගයේ දී ඉදිරිපත් කරන සාක්ෂි දිවුරුම් පත්‍රයක ආකාරයෙන් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එසේ සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා නියම කරන දිනයකදී පාර්ශවකරුවන් විසින් ලිඛිත කරුණු සැලකිරීම් ඇත්නම් එම ලිඛිත කරුණු සැලකිරීම් සමගාමීව ඉදිරිපත් කළ යුතු ය.

(9) සාක්ෂි සහ විභාගයේ දී පාර්ශවකරුවන් ඉදිරිපත් කරන කරුණු සැලකිරීම් සලකා බැලීමෙන් අනතුරුව හැකිතාක් ඉක්මනින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආරවුල පිළිබඳව ඔහුගේ තීරණයට එළඹ එම තීරණය පාර්ශවකරුවන් වෙත දැනුම් දිය යුතු ය.

(10) ප්‍රෝක්ත උල්ලංඝනකරු විසින් (6) වන ඡේදයේ විධිවිධාන කඩකල අවස්ථාවක හෝ විධාන කරනු ලැබූ පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරියේ පෙනී සිටීම පැහැර හැරි හෝ නොසලකා හැරි අවස්ථාවක අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒකපාක්ෂිකව තීරණයක් කරනු ලැබිය හැකි ය.

ජනප්‍රවාද

4 (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා පනතේ 24 වන වගන්තියේ (4) වන උපවගන්තියේ සඳහන් නිසි බලධරයා විය යුතු ය.

(2) පනතේ 24 වන වගන්තියේ (4) වන උපවගන්තියේ සඳහන් බලය ලබාදීම සඳහා කෙරෙන ඉල්ලීමක් මෙහි පළමුවැනි උපලේඛනයේ සඳහන් සී 02 දරන ආකෘතියට සාරානුකුල විය යුතු හා දෙවන උපලේඛනයේ සඳහන් ගාස්තුව ද සමග විය යුතු අතර එය ඉල්ලුම්කරු හෝ ඔහුගේ විධිමත් ලෙස පත්කරන ලද අනුනියෝජිතයකු විසින් අත්සන් කර තිබිය යුතු ය.

(3) බලය ලබාදීම උචිත යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත්වීමෙන් පසු කාලසීමාව, අරමුණු හා පැනවිය යුතු සීමාවන් ද ඇතුළු තමන් විසින් උචිත යයි සලකනු ලබන කොන්දේසිවලට යටත්ව බලය ලබා දිය යුතු ය.

(4) පනතේ 24 (5) වගන්තියේ නිශ්චිතව සඳහන් මුදල් කුමන සංස්කෘතික සංවර්ධන අරමුණක් අරභයා ප්‍රයෝජනයට ගත යුතු ද යන්න අධ්‍යක්ෂ ජනරාල්වරයා හා සංස්කෘතික කටයුතු විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා සමග සාකච්ඡා කිරීමෙන් පසු වෙළඳ, වාණිජ සහ පාරිභෝගික කටයුතු විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තීරණය කළ යුතු ය.

(5) පනතේ 176 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පනතේ 24 වන වගන්තිය (4) වන උපවගන්තිය යටතේ එකතු කරන ලද මුදල් වෙනම ගිණුමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වාගත යුතු ය.

සාමූහික සංගම්

5. (1) පනතේ 25 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම මෙහි පළමුවැනි උපලේඛනයේ සඳහන් සී 03 ආකෘතියට සාරානුකූල විය යුතු අතර, එය ඉල්ලුම්කරු හෝ ඔහුගේ විධිමත් ලෙස පත්කරන ලද නියෝජිතයකු විසින් අත්සන් කළ යුතු ය.

(2) සමිතිය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම්පත සමග ඉල්ලුම්කරු විසින් සමිතියේ සාංගමික සංස්ථා පත්‍රය හා ව්‍යවස්ථාවලිය හෝ සමිතියේ ව්‍යවස්ථාව හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) පනතේ 25 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ සමිතිය ලියාපදිංචි කිරීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ බවට සමිතියට සහතිකයක් නිකුත් කළ යුතු ය.

(4) නම, ලිපිනය, ලියාපදිංචි අංකය, අයිතිවාසිකම්වලට අදාල විෂය ක්ෂේත්‍රය, පන්තිය, ඉල්ලුම්කරුගේ වෘත්තිය ප්‍රවීණතාව සහ අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා සලකන වෙනත් තොරතුරු එම සහතිකයේ ඇතුළත් විය යුතු ය.

(5) කිසියම් සමිතියක් අදාල අයිතිවාසිකම් හිමිකරුවන්ගේ ස්වාර්ථ සම්බන්ධතාවලට අනර්ථදායක වන ආකාරයෙන් පාලනය කරනු ලබන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සතුව තොරතුරු ඇතොත්, ඒ පිළිබඳ පරීක්ෂණයක් සඳහා පැමිණෙන ලෙස සමිතියේ පාලක මණ්ඩලයට නියම කළ යුතු ය. සමිතියේ කාර්යයන් පිළිබඳව උනන්දුවක් දක්වන කිසියම් පුද්ගලයකු වෙතොත් ඔහුට ද එවැනි පරීක්ෂණයකට සහභාගි වන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(6) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සමිතියට සම්බන්ධ සියලු ලේඛන, ලිපිගොනු සහ තොරතුරු පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(7) අදාල අයිතිවාසිකම් හිමිකරුවන්ගේ ස්වාර්ථ සම්බන්ධතාවලට හානිකර ආකාරයකින් සමිතිය පවත්වාගෙන යන බවට සෑහීමට පත් වූ විටක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සමිතියේ ලියාපදිංචිය සහ ව්‍යාපාර කටයුතු කිරීමට සමිතියට ඇති අවසරය අවලංගු කළ යුතු ය.

(8) සෑම සමිතියක් විසින්ම, සෑම මුදල් වර්ෂයක් අවසානයේ දීම සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරන ලද සමිතියේ අවසන් ගිණුම් වාර්තාව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. අදාල වර්ෂය තුළ වූ සමිතියේ කාර්ය සාධන වාර්තාවක් ද ඒ අවසාන වාර්තාවට ඇතුළත් විය යුතු ය.

මේ නියෝගවල කාර්ය සඳහා ‘සුදුසුකම් ලත් විගණකවරයා’ යන යෙදුමෙන් :

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි ගණකාධිකාරී සමාගමක් අදහස් වේ.

## පළමුවැනි උපලේඛනය

| | |
|---|---|
| සී 01 ආකෘතිය<br>2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත<br>ප්‍රකාශන අයිතිය හා සම්බන්ධිත අයිතීන්<br>ආරවුල් නිරාකරණය සඳහා අයදුම් පත | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි*<br>ලැබුණු දිනය : ............................................................. |

| | |
|---|---|
| ඉල්ලුම්කරු | |
| නම : | |
| ලිපිනය : | |
| දුරකථන හා ෆැක්ස් අංක හා<br>ඊ-මේල් ලිපිනය (තිබේනම්) : | |
| වගඋත්තරකරු : | |
| නම : | |
| ලිපිනය : | |
| දුරකථන හා ෆැක්ස් අංක හා<br>ඊ-මේල් ලිපිනය (තිබේනම්) : | |
| නිරාකරණය කළයුතු ආරවුල පිළිබඳ<br>විස්තරය (අවශ්‍ය නම් අතිරේක කොළ අමුනන්න.) : | |
| අයදින සහනය : | |

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සඳහන් කරමින් ඉහත සඳහන් ගැටලුව නිරාකරණය කිරීමට පියවර ගෙන සුදුසු තීරණයකට එළඹෙන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා ගෙන් ඉල්ලා සිටිමි. අවශ්‍ය දිවුරුම් ප්‍රකාශ අමුණා ඇත.

..........................................................

අත්සන.

දිනය : ...........................

| | |
|---|---|
| සී 02 ආකෘතිය<br><br>2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත<br><br>ජනප්‍රවාද<br><br>බලය පැවරීම සඳහා අයදුම් පත | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි*<br><br>ලැබුණු දිනය : ..............................................................<br><br>ගාස්තු ලැබුණ දිනය : .................................................... |

| | |
|---|---|
| ඉල්ලුම්කරු | |
| නම : | |
| ලිපිනය : | |
| දුරකථන හා ෆැක්ස් අංක හා<br>ඊ-මේල් ලිපිනය (තිබේනම්) : | |
| අදාල ජනප්‍රවාදය හඳුනාගැනීම : | |
| දනී නම්, ප්‍රභවය : | |
| දනී නම්, ජනප්‍රවාදය දරන්නා : | |
| බලය පැවරීම අවශ්‍ය වන්නේ<br>කිනම් කාර්යයන් සඳහාද යන වග : | |
| සකස් කෙරෙන පිටපත් ප්‍රමාණය : | |
| ඉදිරිපත් කෙරෙන වාර ගණන : | |
| විකාශනය කෙරෙන වාර ගණන : | |

ඉහත සඳහන් ජනප්‍රවාදය මෙහි සඳහන් කාර්යයන්ට පමණක් සීමා කිරීමට භාර ගනිමි. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන වෙනත් කොන්දේසියක් වේතොත් එයට යටත්ව ක්‍රියා කරමි.

....................................................
අත්සන.

දිනය : ............................

| සී 03 ආකෘතිය<br><br>2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත<br><br>ප්‍රකාශන අයිතිය හා සම්බන්ධිත අයිතීන් සමිතියක් ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීමේ අවසරය සඳහා අයදුම් පත | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි*<br><br>ලැබුණු දිනය : ............................................................. |
|---|---|
| ඉල්ලුම්කරු | |
| නම : | |
| ලිපිනය : | |
| දුරකථන හා ෆැක්ස් අංක හා ඊ-මේල් ලිපිනය (තිබේනම්) : | |
| ලියාපදිංචි කිරීම හා අවසරය අයදින අයිතීන් ක්ෂේත්‍රය/පංතිය : | |
| අයදුම්කරුගේ හැකියාව හා වෘත්තිය දක්ෂතාවය සම්බන්ධ විස්තර (අවශ්‍ය නම් අතිරේක කොළ අමුණන්න.) : | |

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදිය. 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත යටතේ සමිතිය ලියාපදිංචි කරන ලෙස හා බලපත්‍ර නිකුත් කිරීමේ අවසරය ඉල්ලා සිටිමි. ව්‍යවස්ථාවේ/සංස්ථාපත්‍රයේ හා ව්‍යවස්ථාවලියේ පිටපතක් අමුණා ඇත.

......................................................
අත්සන.

දිනය : ............................

දෙවැනි උපලේඛනය

*ගාස්තු*

ප්‍රකාශන අයිතිය හා සම්බන්ධිත අයිතීන්

24(4) වගන්තිය යටතේ බලය පැවරීම සඳහා ගාස්තු

| | | |
|---|---|---|
| (i) | ප්‍රති නිෂ්පාදනය | පිටපත්වල වාණිජ වටිනාකමින් 2% |
| (ii) | එක් දර්ශණයක් සඳහා | රු. 500 |
| (iii) | එක් විකාශයක් සඳහා | රු. 500 |
| (iv) | මහජනයා සඳහා වෙනත් සන්නිවේදන කාර්යයන් සඳහා | රු. 500 |
| (v) | පරිවර්තනයක් හෝ අනුවර්තනයක් සඳහා | රු. 500 |

11–33

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී